දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

SPRPTA

පුරප්පාඩු

දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ:

තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව
● කළමනාකාර සහකාර III ශ්‍රේණිය (තාක්ෂණික නොවන) (MA1-1)	05
● ස්ථාන පාලක III ශ්‍රේණිය (තාක්ෂණික නොවන) (MA1-1)	10
● ජංගම පරීක්ෂක III ශ්‍රේණිය (තාක්ෂණික නොවන) (MA1-1)	05

Gazette.lk

* සුදුසුකම්:

I. අ.පොස. (සා/පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

II. අ.පොස. (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 3 ක් සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර).

* අතිරේක සුදුසුකම්:

I. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම

II. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් තිබීම.

- වයස : අවු. 18 ට නොඅඩු අවු. 45 ට නොවැඩි විය යුතුය.
- වැටුප් පරිමාණය : 2025.03.25 දිනැති 01/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව තනතුරට හිමි වැටුප් පරිමාණය රු. 46,220 - 10X540 - 7X630 - 4X890 - 20X1,190 = 83,390/=
- වෙනත් දීමනා : රජය මගින් තනතුරට අදාළ අනුමත දීමනා හා වරප්‍රසාද වලට හිමිකම් ඇත.
- බඳවා ගැනීමේ ක්‍රමය : පත්වීම් බලධාරියා විසින් පත් කරන මණ්ඩලයක් විසින් පත්කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

* පොදු කොන්දේසි (සියලු තනතුරු සඳහා):

සෑම ඉල්ලුම්කරුවෙකුම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

තෝරා ගනු ලබන අයදුම්කරු විසින් දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක විය යුතුය.

- අයදුම්පත් - අයදුම්කරුවන් සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අදාළ පෞද්ගලික විස්තර සහිතව සකස් කරන ලද ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු අතර, සුදුසුකම් සනාථ කිරීමට ඉදිරිපත් කරනු ලබන සියලුම ලිපිලේඛන සහතික පත්‍රයන්හි ඡායා පිටපත්ද අයදුම්පත සමග අමුණා එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්තවූවන් තම සේවා ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය: බාහිර අයදුම්කරුවන් 2026/11/20 වැනි දින හෝ ඊට පූර්වම පහත සඳහන් ලිපිනය වෙත ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,
අංක 67,
ලේන්බාන් වීදිය,
කොටුව, ගාල්ල.

දු.අංක : 091 2234237 / 2227073-74

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED